සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ] All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# දෙවැනි වාර ඇගයීම -2015
இரண்டாம் தவணைப் மதிப்பீடு -2015
Second Term Evaluation -2015

11 ශ්‍රේණිය
11 கல்லூரியமுளா
Grade 11

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I පත්‍රය
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I
Communication & Media Studies I

පැය එකයි
1 மணித்தியாலம்
One Hour

සැලකිය යුතුය:
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට අදාළ වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න. (ලකුණු 40 කි)

01. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   I. ඕනෑම සත්‍ය තොරතුරක් ප්‍රවෘත්තියකි.
   ii. අතිශය ත්‍රාසජනක තොරතුරක් ප්‍රවෘත්තියකි.
   iii. ජනමාධ්‍යයකින් වාර්තා වූ තොරතුරක් ප්‍රවෘත්තියකි.
   iv. ලෝකයේ ඕනෑම සිදුවීමක් ප්‍රවෘතියකි.

02. ප්‍රවෘත්තියක් තෝරාගැනීමේ සාධක වලින් වඩාත්ම වැදගත් වන්නේ,
   I. ප්‍රචාරාත්මක බවයි.
   ii. සානුකම්පිත බවයි.
   iii. කාලෝචිත බවයි.
   iv. දේශපාලනික බවයි.

03. යටිකුරු පිරමිඩ සංකල්පයට අනුව සිද්ධියක් වාර්තා කිරීමේ දී වැදගත් කරුණු ,
   I. මුලින්ම ඉදිරිපත් කිරීම.
   ii. අවසානයට ඉදිරිපත් කෙරේ.
   iii. අනු පිළිවෙළ නොසලකා ඉදිරිපත් කෙරේ.
   iv. ජනප්‍රියත්වය මත ඉදිරිපත් කෙරේ.

04. ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී වඩාත් සරල හා සුගම භාෂා ශෛලියක් භාවිතා කිරීමට අවශ්‍ය වන මාධ්‍ය ලෙස සැලකිය හැක්කේ,
   I. පුවත්පත යි
   ii. ගුවන් විදුලියයි.
   iii. සඟරාව යි.
   iv. රූපවාහිනිය යි.

05. ප්‍රවෘත්තියක් ග්‍රාහකයාගේ ආකර්ශනයට ඉක්මනින්ම යොමු වන්නේ,
   I. මුල් පාඨයේ ආකර්ශනය තුළිනි
   ii. ශීර්ෂ පාඨයේ ආකර්ශනය තුළිනි.
   iii. අන්තර්ගතයේ ආකර්ශනය තුළිනි.
   iv. රචනා ශෛලියේ ආකර්ශනය තුළිනි.

06. ජනමාධ්‍ය ආයතනයක අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය මෙහෙයවනු ලබන්නේ,
   I. අධ්‍යක්ෂක.
   ii. නිෂ්පාදක.
   iii. ප්‍රධාන විධායක.
   iv. සභාපති

07. ජනමාධ්‍ය ආයතනයක පොදු අභ්‍යන්තර ව්‍යුහයෙහි හා ක්‍රියාකාරීත්වයෙහි වෙනස්කම් පැවතීමට හේතුවන්නේ,
   I. මූලික ස්වභාවයන්.
   ii. සාම්ප්‍රදායික කාර්යයන්.
   iii. සාමාන්‍ය කාර්යයන්.
   iv. වෘත්තිය කාර්යයන්.

08. 5W සහ 1H සංකල්පය තුළින් අපට මග පෙන්වන්නේ,
   I. රූපවාහිනී පිටපත් රචනයටය.
   ii. විශේෂාංග ලිපි රචනයටය.
   iii. කෙටි කතා රචනයටය.
   iv. ප්‍රවෘත්ති රචනයටය.

09. රූපයක් චලනය කිරීමට මානවයා පෙළඹ වූ මූලික ස්වරූපය වූයේ,

I. කැමරා කුච්ක්කුවයි. ii. මැජික් ලන්තෑරුමයි.
iii. සෙවනැලි නාටකයයි. iv. ගල්ලෙන් චිත්‍රය යි.

10. ෂැනොන් වීවර් ආකෘතිට අනුව සම්ප්‍රේෂකය තුළින් සිදුකරන සන්නිවේදන ක්‍රියාව වන්නේ,

I. බාධක මඟහැරීම යි. ii. සංදේශ සම්පාදනය යි.
iii. ආකේතකරණය යි. iv. විකේතකරණය යි

11. පරිගණකයකින් සිදුකළ යුතු සෑම කාර්යයක්ම පැහැදිලි කරදෙනු ලබන්නේ,

I. ප්‍රධාන විදුලි පරිපථය. ii. දෘඩාංග.
iii. මධ්‍යම සැලසුම් ඒකකය. iv. මෘදුකාංග.

12. පහත සඳහන් කරුණු අතරින් මාධ්‍ය හා සෞන්දර්ය වැඩසටහන් නිරන්තරයෙන් ඉදිරිපත් කරනුයේ,

I. රූපවාහිනිය හා පුවත්පත. ii. ගුවන් විදුලිය හා රූපවාහිනිය.
iii. ගුවන් විදුලිය හා පුවත්පත. iv. රූපවාහිනිය හා ශාස්ත්‍රීය පතපොත.

13. පොතක් මුද්‍රණ දෝෂ පිළිබඳ ප්‍රධාන වශයෙන් වගකිව යුත්තේ,

I. මුද්‍රණ ශිල්පියාය. ii. පරිගණක ශිල්පියාය.
iii. පොතේ ප්‍රකාශකයා ය. iv. සෝදුපත් බලන්නාය.

14. අනෙකුත් මාධ්‍ය හා සැසඳීමේ දී මුද්‍රිත මාධ්‍යයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වන්නේ,

I. පරිහරණය සඳහා තාක්ෂණික පහසුකම් අවශ්‍ය වීමයි.
ii. පාඨකයාට අභිමතය පරිදි භාවිතා කළහැකි වීමයි.
iii. සංරක්ෂණය කිරීම සඳහා තාක්ෂණය අවශ්‍ය වීමයි.
iv. භාෂා සාක්ෂරතාව අවශ්‍ය නොවීමයි.

15. අදහස් ලිවීම සඳහා කඩදාසි සොයා ගැනීම ලිඛිත සන්නිවේදනයේ සුවිශේෂී අවස්ථාවකි. ඒ සඳහා මුල් වූයේ,

I. ජපන් ජාතිකයින් ය. ii. ජර්මන් ජාතිකයින් ය.
iii. චීන ජාතිකයින් ය. iv. රුසියානු ජාතිකයින් ය.

16. යුනෙස්කෝ සම්මතයට අනුව මුද්‍රිත ලේඛනයක් පොතක් ලෙස සැලකීමට අවශ්‍ය අවම පිටු ප්‍රමාණය වන්නේ,

I. පිටු 32 යි. ii. පිටු 49 යි.
iii. පිටු 65 යි. iv. පිටු 20 යි

17. පුවත්පත් ආයතනයක සංස්කාරක වගකීම එක් පුද්ගලයකුට පවරන ලද විට, එම තනතුර හඳුන්වනු ලබන්නේ,

I. ප්‍රධාන කර්තෘ ලෙස ය. ii. කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ලෙස ය.
iii. ප්‍රධාන සංස්කාරකවරයා ලෙස ය. iv. අධ්‍යක්ෂ ජනරාල් ලෙස ය.

18. ජනමාධ්‍ය බෙදනු ලබන ප්‍රධාන කොටස් වනුයේ,

I. මුද්‍රිත මාධ්‍ය හා රූපමය මාධ්‍ය ලෙසය. ii. විද්‍යුත් මාධ්‍ය හා දෘශ්‍ය මාධ්‍ය ලෙසය.
iii. මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ලෙසය. iv. විද්‍යුත් මාධ්‍ය හා පුවත්පත් මාධ්‍ය ලෙසය.

19. පහත සඳහන් ප්‍රකාශ අතුරින් අසත්‍ය පිළිතුර තෝරන්න,

A - පුවත්පත මුද්‍රිත මාධ්‍යය කි.
B - පෝස්ටරය වාචික මාධ්‍යය කි.
C - ගුවන් විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යය කි.
D - රූපවාහිනිය දෘශ්‍ය මාධ්‍යය කි.

I. A ය. ii. B ය. iii. C ය. iv. D ය.

20. වෙනත් මාධ්‍ය හා සැසඳීමේ දී ගුවන් විදුලිය මාධ්‍යයේ සුවිශේෂී ලක්ෂණය වනුයේ,

I. පරිකල්පනය ඉහළ මට්ටමක තිබීමයි.
ii. අධ්‍යාපනය ලබා දීම.
iii. රසඥතාව දියුණු කිරීම
iv. ප්‍රවෘත්ති ප්‍රචාරය වීමයි.

21. ගුවන් විදුලි මධ්‍යයේ තාක්ෂණික වෘත්තීන් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

I. ඉන්ජිනේරුවන්, ක්‍රියාකාරී සහයකයන්, නාට්‍ය ශිල්පීන්.
ii. ඉංජිනේරුවන්, කාර්මික නිලධාරීන්, ක්‍රියාකාරී සහයකයන්.
iii. කාර්මික නිලධාරීන්, ගායන ශිල්පීන්, ඉංජිනේරුවන්.
iv. නාට්‍ය ශිල්පීන්, ගායන ශිල්පීන්, කාර්මික ශිල්පීන්.

22. ගුවන් විදුලියේ භාවිත වන වැඩසටහන් අතරින් එක් පුද්ගලයෙකු සහභාගි වන වැඩසටහනක් වන්නේ,

I. පිටපත් ඇති ව කරන කතාවක්.
ii. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්.
iii. ක්‍රීඩා වැඩසටහන්
iv. වාර්තා වැඩසටහන්

23. ගුවන් විදුලිය මාධ්‍ය පිළිබඳ කියවෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ. ඒ අතරින් සත්‍ය ප්‍රකාශය වන්නේ,

A - පෞද්ගලිකව ශ්‍රවණය කරන මාධ්‍යයකි.
B - පණිවිඩ තේරුම් ගන්නේ තම තමාට අභිමත පරිදි වේ.
C - ගුවන් විදුලිය පුද්ගලයාගේ පරිකල්පන ශක්තිය දියුණු කරයි.
D - ගුවන් විදුලි පණිවිඩ යළි යළිත් පරිශීලනය කළ හැකිය.

I. A,B,C.
ii. A,B,D.
iii. A,C,D
iv. B,C,D.

24. ගුවන් විදුලි ආයතනවල ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම දරණ නිලධාරිහු සිටිති. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මෙම තනතුර හඳුන්වන්නේ,

I. කාර්මික නිලධාරීන්.
ii. ඉංජිනේරු ශිල්පීන්.
iii. සංස්කරණ නිලධාරීන්.
iv. වැඩසටහන් නිෂ්පාදක.

25. ගුවන් විදුලි මාධ්‍ය හඳුන්වන්නේ,

I. ශ්‍රව්‍ය මාධ්‍යයකි
ii. දෘශ්‍ය මාධ්‍යයකි.
iii. ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයකි.
iv. නිශ්චල මාධ්‍යයකි.

26. ගුවන් විදුලි මාධ්‍යයේ ස්වාමියා,

I. නිවේදකයා ය.
ii. ශ්‍රාවකයා ය.
iii. නිෂ්පාදකවරයා ය.
iv. අධ්‍යක්ෂවරයා ය.

27. ගුවන් විදුලි නාට්‍ය පිටපතක් රචනයේ දී අවධානයට ගත යුතු කරුණු කිහිපයක් පහත දැක් වේ.

A - මැනවින් හඳුනාගත් කතා වස්තුවක් තිබීම.
B - හොඳින් හඳුනාගත හැකි චරිත පැවතීම.
C - ආරම්භයේ සිට අවසානය දක්වා පවතින තාර්කික සබඳතාව

මේ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

I. A.
ii. B.
iii. C.
iv. ඉහත සියල්ලම.

28. සිනමාව හෝ රූපවාහිනී කෘතියක් නිර්මාණය සඳහා පදනම ලෙස සැලකිය හැකි වනුයේ,

I. රංගනය යි.
ii. සංස්කරණය යි.
iii. වේෂ නිරූපනය යි
iv. තිර පිටපත යි.

29. සිනමා පටයක් නිර්මාණය සඳහා මුදල් ආයෝජනය කරනුයේ,

I. අධ්‍යක්ෂවරයා ය.
ii. නිෂ්පාදකවරයා ය.
iii. කලා අධ්‍යක්ෂවරයා ය.
iv. සංස්කාරකවරයා ය.

30. සිනමාව හෝ රූපවාහිනී හෝ නිර්මාණයක සංස්කරණය වඩාත් වැදගත් වන්නේ එමගින්,

I. නිර්මාණයේ දිග අඩුකර ගත හැකි බැවිනි.
ii. අනවශ්‍ය දර්ශන ඉවත් කර ගත හැකි බැවිනි.
iii. නිර්මාණයේ රිද්මය රඳවා ගතහැකි බැවිනි.
iv. අර්ථය උද්දීපනය කරගත හැකි බැවිනි.

31. සිනමා හෝ රූපවාහිනී හෝ කෘතියක පසුබිම් සංගීතය මගින් ඉටු කෙරෙන්නේ,

I. දර්ශනය අලංකාරවත් කිරීම
ii. නිර්මාණය අලංකාරවත් කිරීම.
iii. රූපය ඉක්මවා නව අරුත මතු කිරීම.
iv. ප්‍රේක්ෂකයා ඇඳ බැඳ තබා ගැනීම.

32. රූපවාහිනී මාධ්‍යයේ දී මෙන්ම සිනමා මාධ්‍යයේ දී ද වඩාත් උචිත ශිල්පීන් තෝරා ගත යුතු වේ. මෙහි දී අවශ්‍ය ගැළපෙන ශිල්පීන් තෝරා ගනු ලබන්නේ,

I. අධ්‍යක්ෂකවරයා ය.
ii. කලා අධ්‍යක්ෂකවරයා ය.
iii. වේෂ නිරූපන ශිල්පීයා ය.
iv. සංස්කාරකවරයා ය.

33. මානසික ප්‍රතිරූප (Mental Image) යන්න වැදගත් වන මාධ්‍ය වන්නේ,

I. සිනමා මාධ්‍ය වේ.
ii. රූපවාහිනී මාධ්‍ය වේ.
iii. වේදිකා නාට්‍ය වේ.
iv. ඡායාරූප මධ්‍ය වේ.

34. නිර්මාණය කරන ලද සිනමා පටය හෝ රූපවාහිනී වැඩසටහන හෝ නිර්මාණය හෝ ග්‍රාහකයන් වෙත ළඟා කිරවීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,

I. පෙර නිෂ්පාදන කටයුතු ලෙසය.
ii. නිෂ්පාදන කටයුතු ලෙසය.
iii. පසු නිෂ්පාදන කටයුතු ලෙසය.
iv. ඉහත සියල්ලම ය.

35. සිනමා හෝ රූපවාහිනී නිර්මාණයක චරිතයට අනුව නළු නිළියන් හැඩගන්වනු ලබන්නේ,

I. කැමරා උපක්‍රම මගිනි.
ii. වේෂ නිරූපනය මගිනි.
iii. තිර පිටපත මගිනි.
iv. තාක්ෂණික උපක්‍රම මගිනි.

36. දෘෂ්ටියේ අඛණ්ඩතා සිද්ධාන්ත මගින් තහවුරු කරනුයේ,

I. යම් වස්තුවක් තුළ ඇති නොපෙනෙන දේ හඳුනා ගත හැකි බවය.
ii. වස්තුවක් විනිවිද දැකීමෙන් සියලුම සිදුවීම් හඳුනාගත හැකි බවය.
iii. රූපය දෘෂ්ටි පථයෙන් ඉවත් වුවත් මුල් රූපයේ මතකය තිබෙන බවය.
iv. සියළුම සිද්ධීන් මතකයේ රඳවා තබා ගැනීමේ හැකියාව තිබෙන බවය.

37. තමා වෙත ළඟාවන ආලෝකය ප්‍රතිබිම්බයක් බවට පත් කිරීමට කැමරාවේ අවශ්‍ය උපාංගය වනුයේ,

I. කැමරා බඳ.
ii. කැමරා කාචය.
iii. පටලය.
iv. කැමරා ද්වාරය.

38. ඒක කාච ප්‍රතිඡායා කැමරාවක් භාවිත කර රූපගත කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත වන්නේ,

I. මානනය, නාභාගත කිරීම, අනාවරණය.
ii. අනාවරණය, මානනය, නාභිගත කිරීම.
iii. නාභිගත කිරීම, අනාවරණය, මානනය.
iv. මානනය, අනාවරණය, නාභිගත කිරීම.

39. කැමරාවක S L R යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

I. ඩිජිටල් තාක්ෂණය.
ii. ඒක කාච ප්‍රතිඡායා.
iii. ද්විත්ව කාච ප්‍රතිඡායා.
iv. ජංගම කැමරාව.

40. ශ්‍රී ලංකාවේ මුලින්ම තිරගත වූ සිංහල චිත්‍රපටය ලෙස සැලකෙන්නේ,

I. රන්මුතු දූව යි.
ii. ගම්පෙරළිය යි.
iii. කඩවුණු පොරොන්දුව යි.
iv. රේඛාව යි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved/

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# දෙවැනි වාර ඇගයීම - 2015
இரண்டாம் தவணைய மதிப்பீடு - 2015
Second Term Evaluation - 2015

11 ශ්‍රේණිය
11 கஸ்வுயமுளா
Grade 11

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II පත්‍රය
தொடர்பாடலும் ஊடகக்கற்கையும் II
Communication & Media Studies II

පැය එකයි
1 மணித்தியாலம்
One Hour

සැලකිය යුතුය:

- පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් සෑම ප්‍රශ්නයක් සඳහාම ලකුණු 10 කි. මුළු ලකුණු 60 කි.

01 එක්තරා පාසලක නවක සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවිය. අනතුරුව සහතික පත් පරීක්ෂා කිරීමට හා දක්ෂතා පිරික්සීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විය. පසුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාසලට ඇතුළත් කර ගැනීම සඳහා උත්සවයක් ද පැවැත් වුහ.

(i) මෙම සිදුවීමට අදාළ පුද්ගලයන් හා අවස්ථා සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග හතරක් ඇසුරෙන් දක්වන්න.
(ii) මෙහි දී ක්‍රියාත්මක වූ සන්නිවේදන වර්ග දෙකක් නම් කර ඊට සම්බන්ධ අවස්ථා ද සමඟ දක්වන්න.
(iii) ඉහත සිදුවීමට අදාල සන්නිවේදන ස්වරූප දෙක බැගින් නම්කර ඊට සම්බන්ධ අවස්ථා ද සමඟ දක්වන්න.
(iv) සිසුන් දැනුවත් කිරීම සඳහා ගතහැකි අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම දෙකක් නම් කරන්න. ඒ පිළිබඳ විස්තර කරන්න.
(v) ශිෂ්‍යයින්ට අයදුම්පත් සකස්කර ගැනීමට හා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට සහතික පත්‍රවල පිටපත් ලබා ගතහැකි තාක්ෂණික ක්‍රමවේදය නම්කර පැහැදිලි කරන්න.
(vi) නවක සිසුන් බඳවා ගැනීම පිළිබඳ පුවත්පතකට සැපයිය හැකි ලේඛන වර්ගයක් සඳහන් කරන්න.
(vii) පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය යන මාධ්‍යයේ දී සන්නිවේදකයා හඳුන්වන විශේෂිත නම මොනවාද ?
(viii) උත්සව අවස්ථාව සිහිවටනයක් ලෙස සංරක්ෂණය කර තබා පසුව දැක ගත හැකි මිල අඩු පහසුම ක්‍රමය කුමක් ද? ලුහුඬින් දක්වන්න.
(ix) උත්සවය පිළිබඳ රූපවාහිනි ප්‍රවෘත්තියක් සැපයීමට නම් තිබිය යුතු අත්‍යාවශ්‍යම උපකරණ දෙකක් සඳහන් කරන්න.
(x) ඉහත සඳහන් සිදුවීමට අදාළ ප්‍රවෘත්තියක් සකස් කිරීමට අවශ්‍ය කරුණු/විස්තර දෙකක් නම් කරන්න.

02 වෙළඳපොළෙහි විවිධ මුද්‍රිත සඟරා දැකගත හැකිය. එමෙන්ම ගුවන් විදුලි හා රූපවාහිනි මාධ්‍යයේ දී විද්‍යුත් සඟරාමය වැඩටසහන් විකාශනය කෙරේ.

(i) මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය යන්න නිර්වචනය කරන්න.
(ii) මුද්‍රිත මාධ්‍ය සඟරාවක හෝ විද්‍යුත් මාධ්‍ය සඟරාමය වැඩසටහනක හෝ ආකෘතිය කවරාකාර දැයි කෙටියෙන් හඳුන්වන්න.
(iii) මුද්‍රිත සඟරාවකට හෝ විද්‍යුත් සඟරාමය වැඩසටහනකට සුදුසු මාතෘකාවක් උදාහරණයක් ඇසුරෙන් දක්වන්න.
(iv) පොදුවේ මුද්‍රිත මාධ්‍යයේ හා විද්‍යුත් මාධ්‍යයේ ප්‍රධාන වෙනස්කම් දෙකක් සරලව පැහැදිලි කරන්න.

03 පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය පිළිබඳ වාර්තාවක් සකස් කර පුවත්පතකට යොමු කළ යුතුව ඇත.

(i) ඉහත කරුණු ඇතුළත් කර පුවත්පතට යොමු කරන ලිපියේ ශිර්ෂ පාඨය ලියා දක්වන්න.

(ii) මුද්‍රිත මාධ්‍යයේ ලක්ෂණ දෙකක් නම් කර විස්තර කරන්න.

(iii) මුද්‍රිත මාධ්‍යයේ භාවිත වන පුවත්පත්, පොත්, අත් පත්‍රිකා පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(iv) ඉහත වාර්තාව පුවත්පත් ආයතනයට ලැබීමේ සිට මුද්‍රණ ද්වාරයෙන් පිටවීම දක්වා ක්‍රියාවලියේ අවස්ථා හතරක් අනුපිළිවළින් දක්වන්න.

04 ප්‍රකට සාහිත්‍ය කෘතියක් ඇසුරෙන් ලියූ ගුවන් විදුලි නාට්‍යක් ප්‍රචාරය විය

(i) ගුවන් විදුලි නාට්‍යයක භාවිතා කළ හැකි අභිනය කුමක් ද?

(ii) එම අභිනයේ භාවිතා කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ගුවන් විදුලි නාට්‍යය ශ්‍රවණය කිරීමේ දී ශ්‍රාවකයාගේ පරිකල්පනය මත සිද්ධීන් අවබෝධ කර ගනී. පැහැදිලි කරන්න.

(iv) නාට්‍යයේ ස්ත්‍රී චරිත බහුල වීම නිසා නාට්‍ය ශ්‍රවණය කිරීමේ දී ශ්‍රාවකයාට අපහසුවක් වූ බව ඇතමෙක් කීහ. එයට හේතුව පැහැදිලි කරන්න.

05 විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයන් පිරිසක් විරෝධතාවක් සංවිධානය කර තිබේ. ඒ පිළිබඳව ප්‍රවෘත්තියක් සැපයීමට සිදුව තිබේ.

(i) ප්‍රවෘත්තියක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

(ii) ඉහත විරෝධතාවය පිළිබඳ ප්‍රවෘත්ති වාර්තාකරණය ශෛලිය කුමක් ද? විස්තර කරන්න.

(iii) ඉහත ප්‍රවෘත්තියේ ඇති ප්‍රවෘත්ති ගුණාංග තුනක් නම් කර පැහැදිලි කරන්න.

(iv) ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී බහුල ලෙස යොදා ගැනෙන තොරතුරු මූලාශ්‍ර හතරක් නම් කර පැහැදිලි කරන්න.

06 සිනමාව යන කලා මධ්‍යයට නිශ්චිත කාලයක් තුළ සහභාගි වන ග්‍රාහක සමූහයාට වඩා එකවර විශාල ප්‍රදේශයක සිටින විවිධ වයස් හා විවිධ බුද්ධි මට්ටම් වල ග්‍රාහක පිරිස් රූපවාහිනිය දෙස බලා සිටිති.

(i) සිනමාව හා රූපවාහිනියේ භාවිතා වන සන්නිවේදන ස්වරූපය නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) සිනමාවේ භාවිතා කළ හැකි සිනමා පට වර්ග දෙකක් නම් කර විස්තර කරන්න.

(iii) රූපවාහිනියේ භාවිතා කළ හැකි වැඩසටහන් තුනක් නම් කර පැහැදිලි කරන්න.

(iv) සිනමා හා රූපවාහිනී මාධ්‍යයේ නිෂ්පාදන ක්‍රියාවලිය මූලික අවස්ථා නම් කර විස්තර කරන්න.

07 නිශ්චල ඡායාරූපයක් යනු දර්ශනයක එක් නිමේෂයක් සටහන් කර ගැනීමකි.

(i) ප්‍රවෘත්තිමය ඡායාරූපයක් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?

(ii) රසායනික ඡායාරූප හා ඩිජිටල් ඡායාරූප භාවිතයේ වෙනස්කම් දෙකක් දක්වන්න.

(iii) නිශ්චල ඡායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි තුනක් නම් කරන්න.

(iv) සිනමා හා රූපවාහිනී මාධ්‍යයේ දී නිශ්චල ඡායාරූප භාවිතයට ගන්නා අවස්ථා හතරක් නම් කරන්න.